# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,936/5 — 1970 දෙසැම්බර් 18 වැනි සිකුරාද — 1970.12.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදි.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

අ.ආ.කා.අංකය: සී. 161/49

1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 50 වැනි වගන්තිය යටතේ, අග්‍රාණ්ඩුකාරතුමන්, කැබිනට් කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ, එම්. එස්. ආලිප් මහතා තම රාජකාරිවලට අමතරව 1970 දෙසැම්බර් 15 වැනි දින සිට කැබිනට් මණ්ඩලයේ ලේකම් වශයෙන් පත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

සී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය,
කොළඹ, 1970 දෙසැම්බර් 15.

12-975

---

අ.ආ.කා.අංකය: සී. 162/49 (9)

අග්‍රාණ්ඩුකාරතුමන් විසින් 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 51 වැනි වගන්තිය යටතේ, අධිකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ඇස්. කනගරායර් මහතා, තම රාජකාරිවලට අමතරව, 1970 දෙසැම්බර් 12 වැනි දින සිට අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, නිහාල් ජයවික්‍රම මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, අධිකරණ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට පත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

සී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය,
කොළඹ, 1970 දෙසැම්බර් 15.

12-976

---

### මිල පාලන පනත

(2 වැනි අධිකාරය වන) අර්ථ නිරූපණ ආඥා පනතේ 12 වෙනි වගන්තිය සමඟ කියවිය යුතු වූ (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 2 වෙනි වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර විදේශීය හා දේශීය වෙළෙඳ ඇමතිවරයා විසින්, මෙහි පහත දැක්වෙන උප ලේඛනයෙහි සඳහන් නිලධරයන් ඔවුන් ගේ වෙනත් රාජකාරි වලට අතිරේකව, 1970 දෙසැම්බර් මස 18 දින සිට මුළු දිවයින සඳහාම (විවිධ ද්‍රව්‍ය) සහකාර මිල පාලකවරුන් වශයෙන් පත් කර තිබේ.

ජ. බ. කැලේගම,
ස්ථිර ලේකම්.
විදේශීය හා දේශීය වෙළෙඳ අමාත්‍යාංශය.

1970 දෙසැම්බර් 18 දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

1. රජයේ බෙහෙත් ගබඩා අධිකාරි.
2. රජයේ බෙහෙත් ගබඩාවේ සියළුම සහකාර අධිකාරීවරුන්.
3. සියළුම නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්.
4. සියළුම රෝහල් වෛද්‍ය අධිකාරිවරුන්.
5. සියළුම දිස්ත්‍රික්ක වෛද්‍ය නිලධාරීන්.

12-973

---

### 1961 මිල පාලන (විවිධ ද්‍රව්‍ය) රෙගුලාසි

මිල පාලක (විවිධ ද්‍රව්‍ය) තැන්පත්, කිරිබණ්ඩා දිසානායක වන මම, 1961 මිල පාලන (විවිධ ද්‍රව්‍ය) රෙගුලාසිවල 1 වෙනි රෙගුලාසිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව, මෙහි පහත උප ලේඛනයේ සඳහන් පුද්ගලයින්, සිය රාජකාරි වලට අතිරේකව, ඉහත සඳහන් රෙගුලාසි වල කාර්යයන් සඳහා බලයලත් නිලධාරීන් ලෙස මෙම නිවේදනයෙන් පත් කරමි.

කි. දිසානායක,
මිල පාලක (විවිධ ද්‍රව්‍ය).

1970 දෙසැම්බර් මස 18 දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සියළුම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු.

12-974

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

938/9 —— ජේ 19075—11,060 (70/12)